# මා පිය උවැටන



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# මා-පිය උවටැන

## (පහන් කණුව දෙසුමකි)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

**ISBN 955 - 1255 - 10 - 0**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

2006

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2002 ඔක්තෝබර්

'සබ්බදානං ධම්මදානං ජිනාති'

ප්‍රකාශනය
ධම්ග්‍රන්ථ මුද්‍රණභාරය

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
දුරකතනය: 011-4302312

# හැඳින්වීම
## (ප්‍රථම මුද්‍රණය)

අන් කිසිදු ශාස්තෘවරයකුට වඩා බුදුපියාණන් වහන්සේ මවුපිය උපස්ථානයේ අගය වර්ණනා කර වදාළහ. ඒ උතුම් ගුණ ධර්මය තුළ ඇත්තේ ජීවිතයකට මූලාධාර වන දෙපොළක් අරමුණු කොට කෘතඥතාව නැමැති සත් පුරුෂ ගුණය පුරුදු කිරීමකි.

තමන් වහන්සේගේ අතීත ජීවිත පන්සියයකදීම මවුපියන්ව සිටි බමුණු යුවළකට බුදුපියාණන් වහන්සේ උපස්ථාන කළ අයුරු විදහා දක්වන මෙම පහන් කණුව දෙසුම මා පිය උවැටන පිළිබඳ එක්තරා ගැඹුරු අංශයක්ද හෙළි කර දෙන්නකි. නූතන සමාජයෙන් මුලුගැන්වී ගෙන යන චිරාගත සමාජ ධර්මයක් බුද්ධ චරිතය ඇසුරින් ඇගැයීමට මෙයින් අවස්ථාව සැළසෙතියි සිතමු.

මෙයට<br>
සසුන් ලැදි,<br>
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය<br>
'පහන් කණුව'<br>
කන්දේගෙදර,<br>
දේවාලේගම<br>
(2546) 2002 ඔක්තෝබර් 07

# නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

**අහිංසකා යෙ මුනයො**
**නිච්චං කායෙන සංවුතා**
**තෙ යන්ති අච්චුතං ඨානං**
**යත්ථ ගන්ත්වා න සොචරෙ**

**-කොධ වග්ග, ධම්මපද**

සැදැහැවත් පින්වතුනි,

කළගුණ සැළකීම ශ්‍රේෂ්ඨ සත්පුරුෂ ගුණයක්. කළගුණ නොසළකන පුද්ගලයා සමාජයේ හැඳින්වෙන්නේ අසත්පුරුෂයෙක්, දුෂ්ටයෙක්, හැටියටයි. කෘතඥතාව ලෝකයේ ඉතාම දුර්ලභ ගුණයක් බව බුදු පියාණන් වහන්සේ වදාළා. ඒ වගේම ඒ දුර්ලභ ගුණය තමන් වහන්සේගේ ජීවිතය තුළින් ඔප් නංවලා මූර්තිමත් කරන්ට බුදුපියාණන් වහන්සේ බොහොම අවස්ථා යොදා ගත්තා. දැන් අපි මේ මාතෘකා කළ ගාථාවට අදාළ නිදාන කථාවත් ඒ වගේ අවස්ථාවක්.

බුදුපියාණන් වහන්සේ සාකේත නුවර සමීපයේ අංජන වනයේ වැඩ වාසය කරන කාලයේ එක දවසක් දා සංඝයා වහන්සේලා පිරිවරා ගෙන නගරයට පිණ්ඩපාතේ වඩිනවා. ඒ වඩින වෙලාවේදී නගරයෙන් පිටතට එන මහලු බමුණෙක් බුදුපියාණන් වහන්සේ දැකලා, වැඳවැටිලා, පිටි පතුල් තදින් අල්ලාගෙන "ඇයි පුතේ, මෙච්චර කාලයක් අපි දකින්නවත් ආවේ නැත්තෙ? දරුවො වුනාම අම්මල තාත්තලාට සළකන්න එපායැ? දැං ඉතිං මං දැක්ක. කෝ අම්ම තාම දැක්කෙ නෑ. එන්න එන්න අම්මවත් දකින්න" කියලා බුදුපියාණන් වහන්සේ කැඳවාගෙන තමන්ගේ ගෙදරට එක්ක ගියා. සංඝයා වහන්සේලාත් ඒ එක්ක වැඩියා. එතකොට බුදුපියාණන් වහන්සේ ආසනයේ වැඩ උන්නට පස්සේ ඒ බැමිණියත් ඇවිල්ලා වැඳලා, "කෝ පුතාලා ඉතින් මේ අම්මල තාත්තල වයස්ගත වුනාම රැකබලා ගන්න එපායැ. ඇයි මෙච්චර කාලයක් අපි දකින්න ආවෙ නැත්තේ? කොහේ ගිහිං හිටියද?" කියල ඊළඟට තමන්ගේ දරුවන්ටත් කථා කරනවා "පුතාලා එන්න මෙන්න අයිය ඇවිත් ඉන්නවා වඳින්න" කියලා. ඉතින් ඒ දරුවොත් ඇවිල්ල වැන්දා. ඊළඟට මේ බ්‍රාහ්මණයා බුදුපියාණන් වහන්සේට ආරාධනා කරනවා "හැමදාම මගේ නිවසට ඇවිල්ලා පිණ්ඩපාතේ වළඳන්න" කියලා. බුදුපියාණන් වහන්සේ වදාළා බුදුවරු එහෙම එකම තැනකටම වඩින්නේ නැත කියලා "එහෙනම් ස්වාමීනි, දානෙට ආරාධනා කරන්න එන අය අපේ ගෙදරටත් යොමු කරන්න" කියල ඉල්ලීමක් කළා. බුදුපියාණන් වහන්සේ ඒකට එකහව ඊට පස්සේ බුද්ධ ප්‍රමුඛ සංඝයා වහන්සේලාට ආරාධනා සඳහා එන හැම දෙනාටම කියනවා අන්න අසවල් බ්‍රාහ්මණයාගේ

ගෙදරටත් ගිහින් කියන්න කියල. එහෙම දැන්වූවාට පස්සෙ හෙට දවසට දානෙ තියෙනවා කියල කිව්වාම බමුණා බුදුපියාණන් වහන්සේ ගැන විශේෂයෙන් සළකලා ආහාරපාන සූදානම් කරගෙන එනවා ඒ දානපළට. වෙනම විශේෂ ආරාධනා නැති හැම අවස්ථාවකම බුදුපියාණන් වහන්සේ මේ බමුණාගේ ගෙදරට වැඩම කළා.

ඉතින් ඔය විදියට දන් පින් කරමින් භාවනා කරමින් මේ බමුණු යුවල මේ මහලු බ්‍රාහ්මණයත් බැමිණියත් - අනාගාමි තත්ත්වය දක්වාම මාර්ගඵල ලැබුවා. මේ අතර සංඝයා වහන්සේලා කථා කරනවා "මේ බ්‍රාහ්මණයා දන්නව නේද බුදුපියාණන් වහන්සේගේ පියාණන් සුද්ධෝදන රජ්ජුරුවො බවත් මහාමයා බිසව මව් බවත්. ඇයි මෙහෙම මේ විදියට තමන්ගේ පුතා කියල ආමන්ත්‍රණය කළේ?" බුදුපියාණන් වහන්සේ මේ සංඝයා වහන්සේලා අතර කෙරෙන මේ කථාව අහල "කුමක්ද මහණෙනි, කථා කරන්නේ?" කියල සොයලා, ඊළඟට ප්‍රකාශ කළා. "මහණෙනි, ඒ බමුණු යුවල තමන්ගෙ පුතාටම තමයි පුතා කියල කියන්නෙ" කියල අතීත ප්‍රවෘත්තිය ප්‍රකාශ කළා. මේ බ්‍රාහ්මණයා නොකඩවා ජාති 500 ක්ම මගේ පියාණන් වෙලා හිටියා. ඊළඟට ඒ වගේම තවත් ජාති 500 ක් සුළු පියා එහෙම නැත්නම් බාප්පා වෙලා හිටියා. තවත් ජාති 500 ක් ලොකු තාත්තා එහෙම නැත්නම් මහප්පා වෙලා හිටියා. ඊළඟට මේ බැමිණියත් ජාති 500 ක් මගේ මව වෙලා හිටියා. තවත් ජාති 500 ක් පුංචි අම්මා වෙලා හිටිය. තවත් ජාති 500 ක් ලොකු අම්මා වෙලා, ඔය විදියට ඒ ඥාතිත්වය නිසයි මෙන්න මේ විදියට හැසිරෙන්නෙ කියල සංඝයා වහන්සේලාට ප්‍රකාශ කරල තවත් ගාථා දෙකකින් වදාළ මේක පිළිබඳව තිබෙන ධර්මතාව. යම් කෙනෙකු තුළ විශේෂ ඇල්මක් ඇති වෙනවා නම්, ප්‍රසාදයක් ඇති වෙනවා නම්, කලින් නොදුටු පුද්ගලයා පිළිබඳව පවා විශ්වාස කිරීමේ වරදක් නැත. මොකද, ධර්මතාව හැටියට ප්‍රකාශ කරනවා.

**පුබ්බෙ ව සන්නිවාසෙන**
**පච්චුප්පන්න හිතෙන වා**
**එවං තං ජායතෙ පෙමං**
**උප්පලංව යථොදකෙ**

කියලා කලින් එක්ව වාසය කිරීමෙන් හෝ පසුව ඇති වූ ඇල්මක් නිසා හෝ ජලයෙහි මානෙල් මලක් ඇති වෙන්නා වගේ ප්‍රේමය, ඇල්ම, ඇති වෙනවා කියල ඒ විධියෙ ධර්මතාවක් සාංසාරික වශයෙන් සම්බන්ධය නිසා ඇති වෙනවා කියලා බුදුපියාණන් වහන්සේ වදාළා. ඊළඟට ඒ විධියටම තුන් මාසයක් විතර ගත කරන කොට මේ දෙන්නා රහත් වුණා. අන්තිමට රහත් වෙලා පිරිනිවන් පෑවා. මේ එකටම පිරිනිවන් පෑම නිසා

මනුෂ්‍යයින් එකතු වෙලා බොහොම ගෞරවයෙන් බුදුපියාණන් වහන්සේගේ මව්පියන් කියන ඒ හැඟීමත් ඇතිව එකටම අරගෙන ගියා ආදාහනය කරන්න. ඊළඟට එතන විශේෂත්වය තියෙන්නේ ඒ ආදාහනය කරන තැනට බුදුපියාණනුත් සංඝයා වහන්සේලා සමග වැඩියා. වැඩලා ඒ ළඟ ශාලාවක වැඩ හිටියා. වැඩ සිටින අවස්ථාවෙ ගමේ ගොඩේ ඒ මනුෂ්‍යයින් ඇවිල්ලා අර සාමාන්‍යයෙන් අවමගුල් අවස්ථාවක ශෝක ප්‍රකාශ කරන්නා වගේ බුදුපියාණන් වහන්සේ අස්වසනවා. "ස්වාමීනි, මේ මවුපියන් නැති වුණා කියලා කණගාටු වෙන්න එපා" කියලා ඒ විදියට අස්වැසූ බවත් සඳහන් වෙනවා. ඉතින් ඒ විදියට ඒ අවස්ථාවේ බුදුපියාණන් වහන්සේ ජීවිතයේ අනිත්‍යතාව, මහළු වයස, ඊළඟට මරණය, ඒ නිසා ලෝකය අතහැර යාමට සිදුවන බව, මේ සියල්ල අතහැරීමට සිදුවන නිසා අප තුළ නොඇල්ම ඇති කරගත යුතු බව, කියන ඒ කාරණා පෙන්නුම් කරමින් මරණ අවස්ථාවට ගැලපෙන ගාථා 10 කින් යුක්ත එක්තරා සූත්‍ර දේශනාවක් ඒ අවස්ථාවේ කළා. "ජරා සූත්‍රය" නමින් ඔය සුත්ත නිපාතය කියන ඒ ධර්ම ග්‍රන්ථයේ එහෙම සඳහන් වෙනවා. ඉතින් ඊළඟට ඒ සියල්ල නිම වුනාට පස්සේ සංඝයා වහන්සේලා අතර ඒත් කථාවක් ඇති වෙනවා. මේ බ්‍රාහ්මණ යුවළ කොහේද උපන්නේ කියල. ඔන්න එතකොට බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. මේ වගේ මුනිවරුන්ට නැවත උත්පත්තියක් දක්වන්ට බැහැ කියල. ඒ කාරණය ප්‍රකාශ කරමිනුයි අපි අර මුලින් මාතෘකා කළ ගාථා ධර්මය වදාළේ.

**අහිංසකා යෙ මුනයො**
**නිච්චං කායෙන සංවුතා**
**තෙ යන්ති අච්චුතං ඨානං**
**යත්ථ ගන්ත්වා න සොචරෙ**

නිතරම කයින් සංවර වූ අහිංසක මුනිවරු යම් තැනකට ගොස් ශෝක නොකරත්ද අන්න එබඳුවූ, ගිලිහී නොයන අන්දමේ තැනකට පත් වෙත්, ඒ කියන්නේ නිවනට පත් වෙත් කියන එකයි එතනින් අදහස් කරන්නේ. 'අච්චුතං ඨානං' කියල එතන දක්වල තිබෙන්නේ චුත නොවන, ගිලිහී නොයන, තැන හැටියට හඳුන්වල තිබෙන්නේ නිවනයි. ඒ ගාථා ධර්මය බුදුපියාණන් වහන්සේ වදාළා.

එතකොට කථාන්තරය දිහා බලන කොට මේ පින්වතුන්ට සමහර විට පුදුම හිතෙන්න පුළුවන්. මේ කතාවෙ එක්තරා අහිංසක අව්‍යාජ බවක් තිබෙනවා. මේ බ්‍රාහ්මණයින්ගේ හැසිරීමත් ඒ අනුව බුදුපියාණන් වහන්සේ ඒකට දක්වූ ප්‍රතිචාරයත්. ඉතින් මේ තුළින් අපි ප්‍රධාන වශයෙන්ම ගන්න ඕනෙ බුදුපියාණන් වහන්සේ තුළ තිබුණු ඒ අර මව්පිය උපස්ථානය

පිළිබඳ, එහෙම නැත්නම් කෘතඥතාව පිළිබඳ ශ්‍රේෂ්ඨ ගුණයයි. බමුණත් බැමිණියත් අර විදියට තමන්ට පුත්‍ර නාමයෙන් ආමන්ත්‍රණය කරන කොට බුදුපියාණන් වහන්සේ "නෑ නෑ මගේ පියා සුද්ධෝදන රජ්ජුරුවෝ" කියල එහෙම කිව්වෙ නෑ. ඒ අවස්ථාවෙ ඒ අයගේ පුත්‍ර ස්නේහයට ගැළපෙන ආකාරයට මහා කරුණාවෙන් ඒක ඉවසා වදාළා. ඇත්ත වශයෙන්ම මේ පින්වතුන් දන්නවා ජාතිස්මරණ ඥානය කියන එක. ඔය වශී නිද්‍රාවට පත් කරල ඇතැම් අය ඒව මතු කරල ගන්නවා. වශී නිද්‍රාවෙන් ඒ අතීත ස්මරණයන් මතු වුනාම හරියට අතීත ජීවිත විදියටම ඒ අය ක්‍රියා කරනව දකින්න ලැබෙනවා. දන් මෙතන අපට හිතා ගන්න තියෙන්නේ මේ බමුණත් බැමිණියත් ඇත්ත වශයෙන්ම බුදුපියාණන් වහන්සේගේ දර්ශනයෙන්ම වශී වෙන්ට ඇති. ඒ දීර්ඝ පුත්‍ර ස්නේහය නිසා - ඒ වෙලාවට පොඩි අමතක වීමකින් වගේ. නමුත් එතන අහිංසක අව්‍යාජ බවක් තිබෙනවා. ඒ හැසිරීම තුළ තමන්ගේම දරුවා හැටියට වගේ සළකලයි ආමන්ත්‍රණය කළේ. ඒ සියල්ලක්ම බුදුපියාණන් වහන්සේ මහා කරුණාවෙන් ඉවසා වදාළා වගේම ඒ තුළින් ඊළඟට මව්පිය උපස්ථානය කිරීමේ අවස්ථාවත් මතු කර ගත්තා.

දන් පින්වතුනි, මව්පිය උපස්ථානය කියල කියන කොට අපි සාමාන්‍යයෙන් හිතන්නේ මව්පියන්ට අත්පා මෙහෙවර කරමින් ආහාරපාන, බෙහෙත්හේත් ආදිය සපයමින් වතාවත් කරමින් වැඳුම් පිදුම් කරමින් ඒ කරන උපස්ථානයයි, අපි මව්පිය උපස්ථානය හැටියට සළකන්නේ. නමුත් බුදුපියාණන් වහන්සේ එක් අවස්ථාවක සංඝයා වහන්සේලාට වදාරළා තිබෙනවා, ඊටත් වඩා ඉහළ මට්ටමේ මව්පිය උපස්ථානයන්. ඒ සූත්‍ර දේශනාවෙ මෙන්න මෙහෙම සඳහන් වෙනවා.

"මහණෙනි, ලෝකයේ දෙන්නෙකුට කළගුණ සළකලා නිම කරන්න බැහැ. කාටද?, මවටත් පියාටත්. අවුරුදු 100 ක් ජීවත් වෙන යම් කිසි පුත්‍රයෙක් තමන්ගෙ දෙමව්පියන්ට කළගුණ සැළකීම කියන ඒ උපස්ථානය කරන්න බලාපොරොත්තුවෙන් මව්පිය දෙදෙනා - ඒ ඉතාමත්ම ජරාජීර්ණ වූ මව්පිය දෙදෙනා - දෙවුරේ හිඳුවාගෙන ඒ අයගේ මළ මූත්‍ර ශුද්ධ කරමින් අවුරුදු සියයක් සියලුම වතාවත් කරමින් නෑම් ඇඟ ඉලීම් ආදී ඒ උපස්ථාන කරමින් අවුරුදු සියයක් අරගෙන ගියත් ඒත් බෑ මවුපියන් කළ දේට ප්‍රත්‍යුපකාර කරල නිම කරන්න" ඒ විදියට බුදුපියාණන් වහන්සේ පළමුවෙන් ප්‍රකාශ කරනවා. ඊළඟට ප්‍රකාශ කරනවා "මහණෙනි, යම් කිසි පුත්‍රයෙක් තමාගේ මවත් පියාත් මේ සත්රුවනින් පිරුණු මහපොළවේ අධිපතිකමට චක්‍රවර්ති රාජ්‍යයට පත් කළත් එහෙම නැත්නම් මේ මුළු මහත් පොළවටම අධිපති රජකමට පත් කළත් ඒත් බෑ සෑහෙන පමණ

මව්පියන්ට ඒ ණය ගෙවන්ට. මොකද ඒකට හේතුව?, මවුපියො කියන්නේ දූ දරුවන් ඇති දැඩි කළ ලෝකය දක්වාලන ඒ විදියෙ උතුම් සේවයක් කරපු, උදව්වක් කරපු, කොටසක්. ඊළඟට බුදුපියාණන් වහන්සේ අවසාන වශයෙන් ප්‍රකාශ කරනවා "නමුත් මහණෙනි, යම්කිසි පුත්‍රයෙක් ශ්‍රද්ධාව නැති තමන්ගේ මවුපියන් ශ්‍රද්ධා සම්පත්තියෙහි පිහිටුවනව නම් ශීල සම්පත්තිය නැති මව්පියන් ශීල සම්පත්තියෙහි පිහිටුවනව නම්, ත්‍යාග සම්පත්තිය නැති මව්පියන් එහෙම නැත්නම් මසුරු මව්පියන් ත්‍යාග සම්පත්තියෙහි පිහිටුවනව නම්, ප්‍රඥාව නැති මව්පියන් ප්‍රඥා සම්පත්තියෙහි පිහිටුවනව නම්, අන්න ඒ පුත්‍රයා ඒ මවුපියන්ට කළගුණ සැළකුවා පමණක් නොවෙයි, සෑහෙන පමණ කළගුණ සැළකුවා පමණක් නොවෙයි, පමණටත් වඩා කළගුණ සැළකුවා වෙනවා" කියල. ඒ විදියට බුදුපියාණන් වහන්සේ වදාළා.

එතකොට අන්න ඒ මව්පිය උපස්ථානය පිළිබඳ ශ්‍රේෂ්ඨ සංකල්පය අනුව බලන කොට බුදුපියාණන් වහන්සේ කළෙත් ඒකයි. අර තුන් මාසයක් ඒ වෙනුවෙන්ම වෙන්වෙලා ඒ බ්‍රාහ්මණයාගේ විශේෂ ඉල්ලීම්වලට ඉඩ සළසමින් සෑහෙන පමණ ඒ දානයෙන් අර දන් කිව්ව වගේ ශ්‍රද්ධාවෙන්, වැඩෙන්න ඉඩ සැළසුවා. ඊළඟට ඒ වගේම ශීල සම්පත්තිය, අපට හිතා ගන්න පුළුවන්. ත්‍යාග සම්පත්තිය - පරිත්‍යාග කරන්න ඉඩ සැලසුවා. අවසාන වශයෙන් ධර්ම දේශනා තුළින් ප්‍රඥා සම්පත්තියත් මතු කරල දීල අන්තිමට ගිහිගෙයි ඉඳගෙනම රහත් කළා ඒ දෙදෙනා. අර ශුද්ධෝදන රජ්ජුරුවන් හා සම්බන්ධ කතාන්තරේ වගේ අපට දන් සමහරවිට සැක හිතෙනවා. අපි හිතාගන්න ඕන සාංසාරික වශයෙන් බෝධිසත්ත්ව කෙනෙක් ඇති දැඩි කිරීම කියන එකම විශාල මහා පාරමී පිරෙන පින්කමක් කියලා. ඒ විශේෂ පුද්ගලයින් මේ ජීවිතයේ බමුණු යුවලක් හැටියට මහා පුණ්‍යස්කන්ධයක් තිබුණු නිසා තමයි බුදුපියාණන් වහන්සේ අර විදියට මවුපියන් තුන් මාසයක් ඇතුළත මාර්ගඵලවලට පමණක් නොවෙයි, අන්තිමට රහත් තත්ත්වය දක්වාම ගෙන ගියෙ.

ඉතින් අපට ඒ මව්පිය උපස්ථානය ගැන හිතන කොටත් බුදුපියාණන් වහන්සේ ඒ අවස්ථාවේ අර වඳින පුදන අවස්ථාවෙ කිව්වෙ නෑ ඔය ගොල්ලො නෙවෙයි මගේ මවුපියො කියල. නමුත් මේ කාලෙ සමහර විට සත්‍ය ප්‍රවෘත්ති අපට අසන්නට ලැබෙනවා සමහර මවුපියන් බොහොම වියපැහැදම් කරල දුකසේ තමන්ගේ දරුවකු ඇතිදැඩි කරනව. උගන්නල නිලතල ලබා දෙනවා. නිලතල දක්වාම ඒ දියුණුව සළසා දෙනවා. නමුත් ඒ පුත්‍රයා සමහර විට ලොකු කාර්යාලයක ලොකු පුටුවක ඉන්න අවස්ථාවෙ තමන්ගෙ පියාණන් පැමිණියාම තමන්ගෙ මිත්‍රයින්ට හඳුන්වල දෙන්නෙ

මේ ගමේ ගොඩේ, කවුරුහරි නිකං අඳුනන මිනිහෙක් කියල. අන්න ඒ විදියට තමන්ගෙ මව්පියන් හඳුන්වා දීමට පවා මැළිවෙනවා. ඒක නිසා තමයි බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ "කතඤ්ඤුකතවේදී පුග්ගලො දුල්ලභො ලොකස්මිං" කියල. ඒ කතඤ්ඤු කතවේදී කියන වචන දෙකක්ම බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. කතඤ්ඤු කියන්නෙ කළගුණ දත්. කළගුණ දන්නවා, කතවේදී කියල කියන්නෙ කළගුණ සළකනවා. ඒ කියන්නෙ දැන් සමහරුන්ට කළගුණ අමතක වෙනවා ඉක්මණින්ම. යම් කිසි කෙනෙක් තමන්ට උදව්වක් කළ බව පවා අමතක වෙනවා. තවත් කෙනෙකුට ඒක මතකයි නමුත් ඒක ප්‍රකාශ කරන්න කැමති නැහැ. ඒකට ප්‍රත්‍යුපකාර කරන්න කැමති නැහැ. ඒකට යොමුවෙන්නෙ නෑ. දැන් කතඤ්ඤු කතවේදී කියන ගුණ දෙකම ඇති කෙනා තමයි ලෝකයේ දුර්ලභ. ඒ වගේම ශ්‍රේෂ්ඨ කෙනෙක්. ඉතින් බුදුපියාණන් වහන්සේ මෙතෙන්දී කළෙත් ඒකයි. තමන්ට කළ උදව්වත් සංඝයා වහන්සේලාට ප්‍රකාශ කළා. ඒ සාංසාරික ජීවිතයේ තමන්ට මව්පියන් වෙලා සිටි බව. ඉතින් ඊළඟට ඒකට ගැලපෙන ආකාරයට ඉහළම උපස්ථානය බුදුපියාණන් වහන්සේ මෙතන කළබව පෙනෙනවා අපට. එයින් අපට බුද්ධ චරිතයෙන්ම වටිනා ආදර්ශයක් මේ කතාන්තරය තුළින් ලැබෙනවා.

ඊළඟට ඒ වගේම තමයි අවමංගල අවස්ථාවේ බුදුපියාණන් වහන්සේ දේශනා කළ ඒ සූත්‍ර දේශනාවත්. ඇත්ත වශයෙන් ගාථාවලින් ඒක සඳහන් වෙන්නෙ. ඒ ගාථාත් හරියටම අවමංගල අවස්ථාවකට සුදුසු අන්දමේ ඒකටම ගැළපෙන වෘත්තයකින්, තාලයකින්, ගෙතුනු මහ පුදුම විදියේ ගාථා පෙළක් ගැඹුරු අර්ථ ඇති. අද පවා සංඝයා වහන්සේලා අවමංගල අවස්ථාවල්වල මේ සූත්‍රයේ ඇතැම් ගාථා උපකාර කර ගන්නවා. මේ ගාථා පෙළ ඇරඹෙන ඒ ගාථාව තුළින් හිතාගන්න පුළුවන් දැන් සමහර විට ඔය අවමංගල අවස්ථාවල සිංගාරම් හඬක් වගේ යම් කිසි ශෝකී වෘතතයක්, හිත ඒ පැත්තට නැඹුරු වෙන විදියක්, ඒ ගාථාවෙ තියෙනවා.

**අප්පං වත ජීවිතං ඉදං**
**ඔරං වස්සසතා පි මීයති**
**යො චෙපි අතිච්ච ජීවති**
**අථඛො සො ජරසාපි මීයති**

කියල ඒ විදියට දක්වනවා 'අපපං වත ජීවිතං ඉදං' මේ ජීවිතය ඉතාමත්ම අල්පයි. බොහොම කෙටි කාලයක් පවතින දෙයක්. සුළු දෙයක්. 'ඔරං වස්සසතා පි මීයති' අවුරුදු සියයකටත් අඩු කාලයකදී කෙනෙක් මිය යනවා. ' යො චෙපි අතිච්ච ජීවති' යම්කිසි කෙනෙක් ඊට වැඩි කාලයක්

සිටිනවා නම්-අවුරුදු සියයකට වැඩි කාලයක් සිටිනවා නම්. 'අථඛො සො ජරසාපි මීයති', ඒ තැනැත්තා කොහොම හරි ජරාව නිසා, මහලු වයස නිසා, හෝ මැරෙනවා. ඉතින් ඒ වගේම සාමාන්‍ය අර්ථ වශයෙන් කියතොත් ඒ ගාථාවල ගැබ් වෙන අදහස් සමූහය, බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඒ එක්කම මේ ලෝකයේ සත්ත්වයා මමය මාගේය කියා ගත්තු වස්තූන් නිසා ශෝකයට පැමිණෙනවා. ඒ වගේම තමන් කියා අල්ල ගත්තු ඒ එකක්වත් නිත්‍ය නැහැ. ඒවා අන්තිමේදී මරණ අවස්ථාවේදී අතහැරල යන්න සිද්ධ වෙනවා. ඒවායෙ ස්වභාවය අතහැරීමමයි. අතහැරෙන්නට වෙන ස්වභාවයයි. ඊළඟට ඒ වගේම දක්වනවා යම්කිසි මනුෂ්‍යයෙක් නින්දෙන් පිබිදුනාට පස්සෙ හීනෙන් දුටු කෙනෙකු නැවත හමුවෙන්න දකින්න නොලැබෙනවා වගේ මිය පරලොව ගිය පුද්ගලයා තමන්ට දකින්නට ලැබෙන්නේ නැත. ඒ වගේම දැන් අපිට අසන්නට දකින්නට ලැබෙන නම් වලින් හැඳින්වෙන අය මිය ගියාට පස්සෙ අන්තිමට නාම මාත්‍රය පමණයි ඉතුරු. ඔන්න ඔය තත්ත්වය නිසා මේ ලෝකයා යම්කිසි දෙයක් මමය මාගේය කියල එහෙම හැඟීමක් ඇතිකර ගත්තොත් ඒ තැනැත්තාට ශෝක වැළපීම් ආදියට මුහුණ දෙන්න සිද්ධ වෙනවා මරණය නිසා. අන්න ඒක නිසා බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ලෝකයේ ප්‍රිය අප්‍රිය කියන ඒ දෙකම නැතිව කෙනෙකු ප්‍රිය හැටියටවත්, අප්‍රිය හැටියටත් සළකන්නෙ නැතිව උපේක්ෂාවට සිත ගේන්න කියල. අන්න ඒ තත්ත්වයයි. ඒ ගාථා පෙළ ඉවර වෙන්නෙ නිවනට සිත යොමු කරලා. ඒක ඉතාමත්ම අලංකාර උපමාවකින් බුදුපියාණන් වහන්සේ දක්වනවා. සාමාන්‍යයෙන් ඔය පියුමේ උපමාව තමයි බුදුපියාණන් වහන්සේ මේ නොඇල්ම පිළිබඳව දක්වන්නේ.

**උදබින්දු යථාපි පොක්ඛරෙ**
**පදුමෙ වාරි යථා න ලිප්පති**
**එවං මුනි නොපලිප්පති**
**යදිදං දිට්ඨසුතමමුතෙසු වා**

සාමාන්‍යයෙන් ඔය නෙලුම් පෙත්තක වතුර බිංදුවක් වැටුණාම ඒක ඇලෙන්නේ නැහැ. ඒක පෙරළිලා යනවා මිසක්. ඒ වගේම නෙලුම් කොළෙත් වතුර රඳන්නෙ නෑ. අන්න ඒ විදියටම ඇසූ දුටු හැම දෙයක් පිළිබඳවම නොඇල්ම ඇති කර ගන්නය කියල ඒ විදියට බුදුපියාණන් වහන්සේ ඒ විරාගී ජීවිතයේ අවසාන කෙළවර අර්හත්වය දක්වාම මේ දේශනාව තුළින් අරගෙන ගියා. අන්න එතකොට ඒ ජරා සූත්‍රයේ තිබෙනවා අර මරණ සතිය දියුණු කරගන්න වටින කාරණා රාශියක්. මරණ සතිය කියල කියන්නෙ අපි කවුරුත් මැරෙන බව සිහිපත් කරනවා. මරණය

සිහිපත් කිරීම තුළින් අප බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? මේ ජීවිතය තුළ අපි අල්ලගෙන සිටින හැම දෙයක් පිළිබඳව ඇති දැඩි ඇල්ම කවදා හෝ අතහරින්න වෙනවා කියන හැඟීම තුළින් ඒ ඇල්ම ඒ දැඩි බන්ධනය ලිහිල් කර ගන්න උත්සාහ කරනවා. ඒක ලිහිල් වෙනවා, නිතර මතක් වෙනව නම් අපි මේව කවද හරි අතහැරලා යනවා කියල. අන්න ඒකයි මේ ගාථාවලින් විශේෂයෙන් බුදුපියාණන් වහන්සේ මතු කරල දෙන්නෙ.

එතකොට අර කථාවේ කියවුනා අර සාමාන්‍ය මනුෂ්‍යයින් ගැන. දැන් සාමාන්‍යයෙන් අපි අවමගුල් තැනකට ගියාම සිරිත් වශයෙන් ඒ ඥාතීන්ට තමන්ගේ ශෝකය ප්‍රකාශ කරනවා. ඒ වගේ අතීත චාරිත්‍ර නිසා වෙන්න ඇති ඒ මනුෂ්‍යයිනුත් අර බුදුපියාණන් වහන්සේ ළඟට ඇවිල්ල සිතන්න ඇති සමහර විට බුදුපියාණන් වහන්සේ මව්පියන් මිය ගිය නිසා ශෝකයට පත් වෙලා වෙන්න ඇතියි මේ ආවෙ කියල. නමුත් බුදුපියාණන් වහන්සේ මෙතනට වැඩම කළේ වෙන එහෙකට නෙවෙයි. වෙන පාංශුකූලයක් බලාපොරොත්තුවෙන් නෙවෙයි. බුදුපියාණන් වහන්සේ එක අතකින් අර මව්පිය උපස්ථානයෙ අවසාන කොටස වගේම චාරිත්‍රයක් හැටියට. තවත් පැත්තකින් බලන කොට ගිහිව රහත් වීම කියන ඒ ශ්‍රේෂ්ඨ වූ ඉතාමත්ම දුර්ලභ සිද්ධියට ගරු කිරීමක් වශයෙන් ධර්ම ගරුත්වයෙන්. තවත් පැත්තකින් බලන කොට ඒක හොඳ අවස්ථාවක් කර ගත්තා. එතන රැස්වුනු සංඝයා වහන්සේලාටත් ඒ ගිහියන්ටත් හැම දෙනාටමත් මරණ සතියට උපකාර වෙන සියල්ල අත හැරීමේ වටිනාකම පෙන්නුම් කරන ගිහි ජීවිතය පිළිබඳව ඇලුම් බැඳුම් කඩලා නෙක්ඛම්මයට සිත යොමු කරන විදියේ ධර්ම දේශනාවක් කරන්න අවස්ථාවක් හැටියට බුදුපියාණන් වහන්සේ යොදාගත්තා. බුදුපියාණන් වහන්සේ කරන කියන හැම දෙයක් තුළම අපි ගැඹුරක් දකින්ට ඕන. ඒ තරම් මහ පුදුමයි බුදුපියාණන් වහන්සේගේ ක්‍රියා කළාපය. බුද්ධ චරිතය අපට එහෙම් පිටින්ම ආදර්ශයක් වෙන්නේ ඒකයි. ඒකෙ හැම පැත්තක්ම අපි හිතලා බලන්ට ඕන. එහෙම නැත්නම් අපට ඒක පේන්නේ නෑ. සාමාන්‍ය සිද්ධියක් හැටියටයි පෙනෙන්නෙ. බුදුපියාණන් වහන්සේ මෙහෙම අවමඟුල් ගෙදරකට ගියේ මොකටද කියලා. නමුත් මෙතන මහ ගැඹුරක් තිබෙනවා. ඉතින් ඒ ගාථා පෙළේ ගැඹුර වගේම තමයි දැන් අපි විශේෂයෙන් සඳහන් කළ මේ ගාථාවේ තිබෙන අදහස.

**අහිංසකා යෙ මුනයො**
**නිච්චං කායෙන සංවුතා**
**තෙ යන්ති අච්චුතං ඨානං**
**යත්ථ ගන්ත්වා න සොචරෙ**

කියල. දැන් මෙතන මේ නිවන ගැනයි කියවෙන්නෙ. මේ 'අච්චුතං ඨානං' කියල කියන්නෙ මොකක්ද? දැන් සාමාන්‍යයෙන් අපි හිතන්නෙ නිවන කියන එක යම් කිසි ලෝකයක්, යම් කිසි තැනක් හැටියටයි. දැන් මෙතනත් තැනක් හැටියට දක්වූවාට මොකද මෙතන මේක ගැඹුරින් තේරුම් ගත යුතුයි. 'චුත නොවෙන තැන'. මේ චුත නොවන තැන කියල කියන්නෙ චුත වීම කියල කියන අදහසත් එක්කම එන එකක් තමයි යම් කිසි ග්‍රහණයක් අල්ලා ගැනීමක් ඇති තැනක තමයි චුත වෙන්නෙ. එතකොට ග්‍රහණයක් නැති තැනක චුත වීමක් නෑ. ගිලිහී යාමක් නෑ.

නිවන පිළිබඳව බුදුපියාණන් වහන්සේ එක් අවස්ථාවක දක්වනවා පැතිරෙන ගින්නක් වගෙයි කියලා. මේ සංසාර පැවැත්ම ලැව් ගින්නක් පැතිරෙන්න වගෙයි. එක අවස්ථාවක බුදුපියාණන් වහන්සේ දකින්න පැමිණියා වච්ඡගොත්ත කියල පරිබ්‍රාජකයෙක්. ඒ පරිබ්‍රාජකයා බුදුපියාණන් වහන්සේට ප්‍රකාශ කරනවා, කුතුහල සාලා නමින් ඒ කාලෙ පැවතුන යම්කිසි සම්මන්ත්‍රණ ශාලා වගේ තැනක ඇතිවුන සාකච්ඡාවක්. පරිබ්‍රාජකයින් කියල කියන ඒ කාලෙ සත්‍ය ගවේෂී පිරිස ඒ ඒ තැන ගිය - ඒ අය එකතු වෙලා සාකච්ඡා කරනවා ඒ කාලයේ බොහොම නම් දරාපු ශාස්තෲවරුන් හැටියට හිටිය පූරණ කස්සප, මක්ඛලී ගෝසාල, නිගණ්ඨනාථපුත්ත ආදීන්ගේ ධර්මයේ සාමාන්‍ය ශ්‍රාවකයා මිය ගියාම උපන් තැන ඒ ශාස්තෲවරයින් එකහෙළා ප්‍රකාශ කරනවා. ඔව් හෝ නෑ හෝ ආදී වශයෙන් යම්කිසි ස්ථිර ප්‍රකාශයක්, උත්තරයක් දෙනවා. ඒ වගේම ඒ ශාසනවල උතුම්ම තත්ත්වයට පැමිණි ශ්‍රාවකයා අසුවල් තැන උපන්නා කියලා ඒ විදියට ප්‍රකාශ කරනවා. නමුත් මේ ශ්‍රමණ ගෞතමයින් තමන්ගේ ශාසනයේ සාමාන්‍ය ශ්‍රාවකයා, මිය ගිය තැන ප්‍රකාශ කළාට මොකද, විමුක්ත පුද්ගලයා, එහෙම නැත්නම් රහත්වුණු පුද්ගලයා කොතන උපන්නාද කියන එක ගැන හරියට කෙලින් ප්‍රකාශයක් කරන්නේ නැත. ඒ වෙනුවට මෙන්න මේ විදියේ දෙයක් කියනවය: ඒ මියගිය තැනැත්තා එහෙම නැත්තම් සංඝයා වහන්සේ තණ්හාව කපා හැරියාය. සසරට බැඳී තිබෙන බැමි අනික් පැත්තට හැරෙව්වාය. මානය කියන එක හරියාකාරව තේරුම් අරගෙන දුක කෙළවර කරාය. අන්න ඒ විදියේ යම්කිසි වාක්‍යයක් කියනවා මිසක් අසුවල් තැනට ගියා කියල ප්‍රකාශ කරන්නේ නැත. කියල ඒ විදියට තර්කයක් වශයෙන් වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුපියාණන් වහන්සේට ප්‍රකාශ කරනවා. ඒ විදියේ සාකච්ඡාවක් ඇති වුනාය. මේක අහලා මටත් සැක ඇති වුනාය, ශ්‍රමණ ගෞතමයන් කියන ධර්මය කොහොමද තේරුම් ගන්නේ කියල. අන්න ඒ අවස්ථාවෙ බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. "වච්ඡ උපාදානයක් කියලා කියන අල්ලා ගැනීමක් ඇති තැන පමණක් මම උපතක් පෙන්වාලමි. අල්වා ගැනීමක්

නොමැති තැන උපතක් දක්වන්නේ නැත" කියල. ඊළඟට උපමාවක් හැටියට දක්වනවා යම් සේ ගින්නක් ගින්නකට අල්ල ගන්න දර ආදී දෙයක් තිබෙනව නම් තමයි පැතිරෙන්නෙ. එහෙම දෙයක් අල්ල ගන්න දෙයක්, නැති වුනාම ගින්න එහෙමම නිවිල යනවය.

ඉතින් ඔය උපමාව කිව්වහම මේ වච්ඡගොත්ත පරිබ්‍රාජකයා තව අතුරු ප්‍රශ්නයක් අහනව. "භවත් ගෞතමය, ඔය දැන් ගිනි සිලක් - ලැව් ගින්නක් පැතිරෙන අවස්ථාවක එහෙම ඔය ගිනි සිලක් - හුළඟින් තල්ලු වෙලා ඈතට ගියාම ඒකෙදි මොකක්ද අල්ල ගන්නේ? උපාදානය වශයෙන් සිටින්නේ කුමක්ද?" කියල ඇසුවාම බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඒ අවස්ථාවේ වච්ඡ වාතය - හුළඟම - තමයි ඒ අවස්ථාවෙ උපාදානය වන්නේ. සුළඟ අල්ලලයි ඒ ගිනි සිල ඈතට විහිදෙන්නේ". ඔන්න ඊළඟට වච්ඡගොතත පරිබ්‍රාජකයා ධර්මයට යොමු කරලා ප්‍රශ්නයක් අහනවා. "දැන් යම් කිසි සත්ත්වයෙක් මේ කය අත හරිනවා.. මේ කය අතහැරලා එක්තරා කයකට පැමිණෙනවා. **මේ කය අතහැරලා එක්තරා කයකට පැමිණෙනවා.** ඒ අවස්ථාවේදී ඒ තැනැත්තාගෙ උපාදානය මොකක්ද?" අන්න ඒ අවස්ථාවෙ බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. " ඒ අවස්ථාවෙදී කෙනෙකුට උපාදානය වන්නේ තණ්හාවයි. තණ්හාවම උපාදානයක් වෙනවා". ගැඹුරු අදහසක් එතන කියවෙන්නෙ තණ්හාවම උපාදානය වශයෙන් සිටිනවා කියල. ඉතින් මෙන්න මෙයින් අපට පෙන්නුම් කරනවා මේ පැවැත්මේ එහෙම නැත්නම් භවයේ එක එකක් සම්බන්ධ වෙන ආකාරය.

නමුත් මෙන්න මේ කාරණය සමහරුන් වරදවලා අරගෙන මෙතන අන්තරා භවයක් කියවෙනව කියල එහෙම මතයකුත් යනවා. මෙතන කියවෙන්නේ මේ කය අතහැරිය එක්තරා කයකට පැමිණෙනවා කියලා. දැන් එහෙම නැත්නම් කියන්න තිබුනෙ ඒක මේ කය අතහැරිය අනිත් කයකට පැමිණෙන්නෙ නෑ කියල. ඒ වෙනුවට කියන්නෙ '**එක්තරා කයකට**' ඉතින් එයින් පෙන්නුම් කරනවා අර මෙතනින් තවත් ජීවිතයකට එකතු වෙන්නෙ තණ්හාව නිසයි. මොකද ඒකට හේතුව තණ්හාව බුදුපියාණන් වහන්සේ හඳුන්වල තිබෙනවා, හැම තිස්සෙම ඉස්සරහට නැඹුරු වෙල තියෙන දෙයක්. ඒකට කියනව 'භව නෙත්ති' කියල. භවය අරගෙන යන එක්කෙනා තමයි මේ තණ්හාව. ඒක නිසාම තමයි තණ්හාව ක්ෂය කිරීමෙන්ම සසර දුක් කෙළවර කරගන්ට පුළුවන් කියල කියන්නෙ. භවයෙන් මිදෙන්න පුළුවන් කියල කියන්නෙ මේ තණ්හාව හැම තිස්සෙම ඉස්සරහට නැඹුරු වෙල තිබෙනවා. ඒ ඉස්සරහට නැඹුරු වීම තුළින් තමයි, ඊළඟට උපාදාන වශයෙන් තවත් භවයක් අල්ල ගන්නෙ. ඉතින් යම්කිසි කෙනෙක් ඒ තණ්හාව සංසිඳවා ගත්ත නම්, ඒ භව නෙත්ති කියල

කියන තණ්හාව සංසිඳුව ගත්ත නම්, අන්න ඒ තැනැත්තාට නැවත භවයක් නෑ. අර ගින්න - දැන් මුළු මහත් සංසාර පැවැත්ම කියල කියන්නෙ පැතිරෙන ගින්නක් වගේ භවයෙන් භවයට ගමන් කිරීමක් නම් ඒකට හේතු වෙන්නෙ උපකාර වෙන්නෙ තණ්හාවයි. ගින්නක් කියන එකට කොයි තරම් දර දැම්මත් ඇති වෙන්නෙ නෑ. ඊළඟට ඒ තණ්හාවම තමයි ඉදිරියට නැඹුරු වෙලා මරණ අවස්ථාවේදී කෙනෙකුට තමන්ගේ සන්තක වස්තු ඒ හැම එකක් තුළින්ම ඒවා අතහැරලා යන්න වෙනවා නේද කියලා බරපතල තණ්හාවක් ඇති වෙනවා. තමන් අවුරුදු සියයක් ජීවත්වුනත් තමන්ගේ ප්‍රාර්ථනා ඉෂ්ට වුනේ නෑ. බලාපොරොත්තු ඉෂ්ට වුනේ නෑ. ඉතින් ඒ ඉතුරු හරිය ඊළඟ භවයට එකතු කර ගන්නවා. ඊළඟ භවයට ප්‍රාර්ථනාවක් ඉබේම වාගේ සිතේ ඇති වෙනවා. ඒ ප්‍රාර්ථනාවට අනුකූලව තමයි කර්මානුරූපව ඉදිරිපත් වන යම්කිසි නිමිත්තක් - සමහර විට ඒක මව් කුසක් වෙන්නත් පුළුවන්. තිරිසන් සතෙකුගේ කුසක් වෙන්නත් පුළුවන්. අපායක් ප්‍රේත ලෝකයක් ඒ විදියේ තත්ත්වයක් වෙන්නත් පුලුවන්. නමුත් මොකක් හෝ වේවා සත්ත්වයා භවය පතන නිසා, මේ තණ්හාවෙ සංසිඳීමක් නැති නිසා, අන්න ඒ නැඹුරුව උඩ අල්ලා ගැනීමක් කෙරෙනවා. ඒ අල්ලා ගැනීම තුළින් තමයි ඊළඟට නැවත භවයක් මැවෙන්නේ. මෙන්න මේකයි ධර්මතාව.

එතකොට යම්කිසි කෙනෙක් ඒ තණ්හාව ඉවත් කරලා තිබෙනවා නම් අර අල්ලා ගැනීමක් නෑ. ග්‍රහණයක් නෑ. ඒකම තමයි දැන් නිවන ගැන කියන කොට ඔය වචන තියෙනවා 'අනාරම්මණං' කියලා නිවන හඳුන්වනවා. අරමුණක් නෑ. ඒ රහතන් වහන්සේගේ සිත අවසාන අවස්ථාවේදී අරමුණක් ගන්නේ නෑ. ඒ වගේම ප්‍රතිෂ්ඨාවක් නෑ. 'අප්පතිට්ඨං' කියලා කියනවා. යම්කිසි තැනක පිහිටලා නෑ. අමුතු ප්‍රණිධි, බලාපොරොත්තු, ප්‍රාර්ථනා ආදියක් නෑ. ඒ වගේම ඒ අර ශූන්‍යත්වය, හිස්බව පිළිබඳ අවබෝධය නිසා පැවැත්මක් ප්‍රාර්ථනා කරන්නේ නෑ. අන්න ඒ විදියේ තත්ත්වයට හිත ගෙන ඒමෙන්මයි මේ සංසාරෙන් මිදෙන්න පුළුවන් කියලයි බුදුපියාණන් වහන්සේ දක්වල තිබෙන්නෙ. ඒකට ප්‍රතිපදාව තමයි බුදුපියාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගය, සතර සතිපට්ඨාන ආදී හැම ධර්‍ම වලින්ම පෙන්නුම් කරලා තියෙන්නේ. අපේ සිත අර ඇලුම් ගැටුම් දෙකෙන් ඉවත් කරලා උපේක්ෂාවට ගෙන ඒමයි. ඇලුම් ගැටුම් දෙක තුළයි මුළු මහත් සංසාර පැවැත්ම පවතින්නේ. ඒ හැම එකකම අර ඉදිරියට නැඹුරුවක් තිබෙනවා. තණ්හාව නිසා. නොසංසිඳුණු තණ්හාව නිසා. එතකොට ලෝකයා මේ දීර්ඝ කාලයක් සංසාරේ යන්නෙ, ඒ තණ්හාව කෙළවර කර ගැනීමේ බලාපොරොත්තුව උඩයි. නමුත් අර ගින්න කොයිතරම් දර දැම්මත් සෑහීමකට පත්වෙන්නේ නැතිව වගේ මේ සංසාරේ කෙළවරක්

නැතිව අපි ඈතට ගමන් කරනවා. යම් කිසි අවස්ථාවක මේ තුළින් ඇති වන දුක අවබෝධ කර ගත්ත නම්, එතකොට බුදුපියාණන් වහන්සේ දක්වන්නේ මෙතනම ඒ තණ්හාව සංසිඳවා ගත හැකි බවයි. බුදුපියාණන් වහන්සේ අර මරණ අවස්ථාවේ මරණය සිහිපත් කරන විදියේ ගාථාවල පෙන්නූ ආකාරයට ලෝකයා තුළ තිබෙන ඒ ඇලුම් ගැටුම් ඉවත් කරලා ප්‍රිය අප්‍රිය භේදයන්ගෙන් හිත මුදා ගෙන උපේක්ෂාවට ගෙන ඒමෙන්මයි, මේ සංසාර විමුක්තිය සැළසෙන්නේ. ඒකට තමයි 'අච්චුතං ඨානං' කියලා කිව්වේ. වෙනම තැනක් නොවෙයි. චුත නොවන තැන. චුතිය කියලා කියන්නේ ගිලිහීයාම. ගිලිහී යන්නේ යම්කිසි තැනක පිහිටා සිටියොත් පමණයි. ඒ පිහිටා සිටින්න උපකාර වෙන්නේ අර තණ්හාවයි, ඇල්මයි.

අන්න ඒ විදියට නුවණින් කල්පනා කරලා බලන කොට මේ පින්වතුන්ට හිතාගන්ට පුළුවන් මේ කතාන්තරය තුළින් අපේ ජීවිතය සකස් කර ගන්න පුළුවන් වටිනා උපදේශ රාශියක් මේ තුළ තිබෙනවා. දැන් විශේෂයෙන්ම ගුණධර්ම වශවෙන් බැලුවම ඒ මව්පිය උපස්ථාන ආදී ඒවා අපි යුතුකම් වශයෙන් කරන්ට ඕන. නමුත් අප අප ගැන හිතලා බලන කොට ඒවා ඇලුම් බැඳුම් හැටියට මව්පිය දූදරුවන් ආදීන් පිළිබඳ පවා අපි ඇලුම් බැඳුම් වල හිරවෙලා හිටියොත් අන්න අර සංසාරේ තවත් ඈතට යනවා. ඒ වෙනුවට කරන්න තියෙන්නේ යථාර්ථය අවබෝධ කරගෙන මේ ලෝකයෙ හැම දෙයක්ම අපි සන්තක වස්තුවත්, මේ හැම ඥාතීනුත් හැම දෙයක්ම අත හැරලා යන්න සිද්ධ වෙනවා කියන අවබෝධය ඇති කරගෙන මේ ධර්ම මාර්ගයේ ගමන් කිරීමයි. ඒකට විශේෂයෙන්ම උපකාර වෙනවා අනිත්‍ය සංඥාව. අනිත්‍ය සංඥාව කියල කියන්නේ මේ හැම දෙයකම ඇතිව නැතිවෙන ස්වභාවයක් තියෙනවා කියන එක. බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙනවා. අපි මේ මමය, මාගේය කියලා ගන්න මේ ශරීරය පවා මොහොතක් මොහොතක් පාසා වෙනස් වෙනවා. අනිත් වස්තූන් පමණක් නොවෙයි එතකොට ඒ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියල අපි ගන්න හැම දෙයකම මොහොතක් පාසා ඇතිවීම් නැතිවීම් ස්වභාවය තියෙනවා. මේක සාමාන්‍යයෙන් අපට පෙනෙන්නේ නෑ.

දැන් අපි තණ්හාව කියලා කියන වචනය තුළ තිබෙනවා දෙබිඩි ස්වරූපයක්. තණ්හාව තුළින් ඇතිවන දෙය තමයි අල්ලා ගැනීම. මේ අල්ලා ගැනීමට උපකාර වෙන්න අපි චිත්තජ රූපයක් වශයෙන් යම්කිසි දෙයක් හිතෙන් ඇති කර ගත්තා. ඒකම තමයි අපි මේ නාම රූප හැටියට හඳුන්වන්නේ. ඇත්ත වශයෙන්ම බුදුපියාණන් වහන්සේ දක්වනවා මෙතන ආත්මයක් කියලා දෙයක් නෑ. නමුත් මේ අපේ හිතට අරමුණු වන දේ

නාම රූප හැටියටයි හඳුන්වන්නේ. නාම ධර්ම කියලා වේදනා සඤ්ඤා චේතනා ස්පර්ශ මනසිකාර කියලා කියන ඒ සිත පිළිබඳ ධර්ම 5 ක් තිබෙනවා. වේදනාවක්, සඤ්ඤාවක්, චේතනාවක්, ස්පර්ශයක්, මනසිකාරයක් කියල කියන ඒ සිත පිළිබඳ ධර්ම තිබෙනවා. ඊළඟට ඒ වගේම අපි රූප කියල කියන්නේ මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියල මේ හැම දෙයක්ම සකස් වෙලා තිබෙන මූලධාතු හැටියට සළකන දේවල්. මේ හැම දෙයක් පිළිබඳවම මේ යථාර්ථය සිහිපත් කරගෙන එදිනෙදා ජීවිතය ගෙවන කොට නාම රූප ධර්ම හැටියට දකිමින් ඊළඟට ක්‍රම ක්‍රමයෙන් පේනවා මේවායේ ඇතිවීම් නැතිවීම් ස්වභාවය. ඒ තුළින් ඇත්ත වශයෙන් අර නාමරූප අරමුණු යම්කිසි අවස්ථාවක විනිවිද දකීමෙන්ම තමයි විමුක්තිය සැළසෙන්නේ.

සාමාන්‍ය ලෝකයා නාම රූපයේ ඇලෙනවා. ඒකෙ එල්බ ගෙන, නාම රූපය නාමරූපය බව තේරුම් නොගෙන, ඒක මමත්වයෙන් අර ගෙන, ඒක තුළ තණ්හාව ඇති කර ගෙන, ඒ තණ්හාව නිසාම නැවත නැවත භව මවනවා. එතකොට අපට කරන්න තිබෙන්නේ අර විදර්ශනා වශයෙන් මෙන්න මේ ධර්ම ස්වභාවය අවබෝධ කර ගන්න එකයි. මෙතන තිබෙන්නේ මේ වේදනා, සඤ්ඤා, චේතනා, ස්පර්ශ, මනසිකාර කියන ධර්ම සමූහයත් ඊළඟට මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා කියන ඒ අපි ද්‍රව්‍ය හැටියට සළකන දේවල තියෙන මූලධාතු ටිකත් - ඔපමණයි තිබෙන්නේ. මේ ඇර අමුතු දෙයක් නෑ කියලා ඒ අවබෝධය තුළින් ඊළඟට නිරන්තරයෙන්ම සිත භාවනාවට නැඹුරු කරවනවානම්, යම් කිසි සමථ භාවනාවක පිහිටලා සිත සමාධිමත් කරගෙන - සමාධිමත් සිතටයි මේවායේ යථා ස්වභාවය වැටහෙන්නේ. අන්න ඒ විදියට ඒ සාමාන්‍ය ලෝකයා සිතන විදිහට නෙවෙයි මේ නිවන කියන එක තේරුම් ගන්ට ඕන. සදාකාලික පැවැත්මක් නෙවෙයි මෙතන 'අච්චුතං ඨානං' කියලා කියන්නේ. මෙතනට චුත නොවන තැන කියල කියන්නේ මෙලොවදීම ඇතිකරගන්න තත්ත්වයක්. මෙලොව දීම මේ අපේ සිත නොගිලිහී යන තත්ත්වයකට පත් කර ගත්තනම් මරණ අවස්ථාවේදී අපට ශෝකයක් ඇති වෙන්නේ නෑ. ඊළඟට වැළපීම් ආදියට හේතුවක් නෑ. මොකද, සිත එහෙම් පිටින්ම නිස්කලංකයි. ඒකට තමයි සියලු සංස්කාරයන්ගේ සංසිඳීම කියලා කියන්නේ. නැවත භවයක් මවන්නේ අපේ මේ සිතයි. මේ සිතෙන්ම අපි ඇතිකර ගන්නවා දෙබිඩි ස්වරූපයක් වගේ තියන තණ්හාව නිසා 'මම' සහ 'මගේ' කියන දෙකක්, ඉබේටම මතු වෙනවා තණ්හාවෙන්. තණ්හාව කියන කොට මමෙක් ඉන්නවා, මා සතු දෙයක් තිබෙනවා. අන්න ඒ විදියෙ දෙබිඩි ස්වරූපය නිසාම අර දන් අපි නිතරම මතු කර ගන්න උපමාව තමයි මේවා තේරුම් ගන්නට - මුවායි මිරිඟුවයි. එතකොට

මුවාගේ තෘෂ්ණාව කියලා කියන ඒ දිය පිපාසය නිසාම ඈත පෙනෙන අර යම් කිසි දෙයක් මිරිඟුවක් හැටියට ඒ මුවා තේරුම් ගන්නේ නෑ. ඒක වතුරෙයි කියලා හිතා ගන්නවා. ඉතින් වතුර එතනයි මා මෙතනයි කියලා මුවා ඒ වතුර බීමට දුවනවා. අන්න ඒ විදියෙ දෙයක් තමයි අර ලෝකයා සාමාන්‍යයෙන් නොසංසිඳුනු තණ්හාව නිසා අසුවන හැම දෙයක්ම - ඒ චිත්ත රූපය - ඒක දෙයක් හැටියට සළකලා ඒක ඔස්සේ දුවනවා. නමුත් බුදුපියාණන් වහන්සේ දක්වන්නේ ඒ දිවිල්ල වෙනුවට මෙතන දීම ඒකෙ යථා තත්ත්වය තේරුම් ගන්න කියලා.

අපට සමහර විට තවත් උපමාවකින් ඕක දක්වන්න පුළුවන්. සමහර කෙනෙක් හෙවනැල්ලට බයේ දුවනවා. තවත් කෙනෙක් හෙවනැල්ල යට කරන්න අල්ලගන්න දුවනවා. අන්න ඒ වගේ දෙපැත්තකටයි ලෝකයා දුවන්නේ. බොහෝවිට මේ ජීවිතය ගැන කලකිරිලා දිවිනසා ගන්නවා. එහෙම නැත්නම් මෙතනින් කෙලවරයි කියලා හිතනවා ඇතැම් කෙනෙක්. තවත් කෙනෙක් හිතනවා මෙතන සදාකාලික ආත්මයක් මේක ඇතුළේ තියනවා. ඒක ආරක්ෂා කර ගෙන ඒකම තමයි බ්‍රහ්මත්වයට ගෙනියන්න ඕන කියලා. ඔය විදියේ නොයෙකුත් දෘෂ්ටිවාද ඇතිකර ගන්නවා. බුදුපියාණන් වහන්සේ විතරයි පෙන්නුම් කරන්නේ මෙතන ඒ අතටවත් මේ අතටවත් දුවන්නේ නැතුව යථාභූත හැටියට ඇත්ත ඇති හැටියට තේරුම් ගන්නෙයි කියලා. ඒ තේරුම් ගැනීමට උපකාර වෙන්නේ අපගේ එදිනෙදා ජීවිතයේදී මේ හැම දෙයක් පිළිබඳවම අන්න අර නාමරූප ධර්ම මතු කරගෙන මේ හැමදෙයක් තුළම තිබෙන්නේ මෙච්චරයි. එහෙම නැත්නම් කියනවා නම් මෙතන රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියලා කියන ඒ ධර්ම සමූහය විතරයි මෙතන තිබෙන්නේ. මම මගේ කියලා ගත යුතු දෙයක් නැත.

අන්න ඒ විදියේ අවබෝධයක් ඇතිව ජීවිතය පිළිබඳව අනිත්‍යතාව මෙනෙහි කරනව නම්, ඇති වීම් නැති වීම් පක්ෂ මෙනෙහි කරනව නම්, ඒ තැනැත්තාට පුළුවන් ක්‍රම ක්‍රමයෙන් අර ඇලුම් බැඳුම් වලින් මිදෙන්න. ඒ වගේම නිතර මරණ සතිය දියුණු කර ගන්න උත්සාහවත් වෙන්ට ඕන. මරණ සතිය කියලා කියනකොට අපි සමහර විට මේක ඈතට දම්මට මොකද මේ හැම මොහොතකම අපේ මේ ශරීරය ගෙවී යනවා. දන් අතන ජරා සූත්‍රයෙ ජරා කියලා කියන්නේ මහලු වයසට. මේ මහලු වයසට පත්වීම හැම මොහොතක් පාසාම අපේ මේ සිරුරේ සිද්ධ වෙනවා. නමුත් අපි ඒක දන්නේ නැහැ. එතනම තමයි අවිද්‍යාව තිබෙන්නේ. මේ හැම මොහොතකම පුදුම අන්දමේ වේගයකින් මේ ශරීරය ගෙවී යනවා. සිත පිළිබඳවත් එහෙමයි. සිතට අසුවන මේ හැම දෙයක්ම අර වඳුරෙක් අත්තෙන්

අත්තට පැනලා යන්න වගේ ඒ අරමුණෙන් අරමුණට හිත පැනලා යනවා. ඉතින් ඒ විදියෙ දෙයක් තුළ කෙනෙක් මමය කියලා එක්තරා වැරදි අදහසක් - භ්‍රාන්තියක් - ඇති කරගෙන තිබෙනවා. ඒකම තමයි සංසාරේ දිගින් දිගට දුකට හේතු වෙන්නේ. ඉතින් ඒකට බුදුපියාණන් වහන්සේ පෙන්නුම් කරලා තිබෙන්නේ මෙතන මේ තියෙන ධර්ම ස්වභාවය මෙනෙහි කරන්නට ඕන කියලයි. ඒවායේ අනිත්‍ය දුක්ඛ අනාත්ම සවභාව - යමක් අනිත්‍ය නම් ඒක දුක් ස්වභාවයක්. ඒ දුක් ස්වභාවයක් ඇති නම් ඒක මමය මාගේය කියලා ගන්න බැරි බව බුදුපියාණන් වහන්සේ නිතරම මතක් කරල දීලා තිබෙනවා.

අන්න ඒ විදියට අපි කල්පනා කරන්න ඕන. එතකොට එදිනෙදා ජීවිතයේ ඒකට උපකාර වෙන දේවල් තියෙනවා. මේ අවබෝධය එකපාරටම බණක් ඇසූ පමණකින් ලැබෙන්නේ නෑ. මේකට ගත යුතු යම් ක්‍රියා මාර්ගයක් තිබෙනවා. ඒක බුදුපියාණන් වහන්සේ දක්වලා තිබෙනවා. කය වචනය හික්මවා ගන්න ඕන ශීලයෙන්. යම්කිසි ශීල සමාදානයක් තුළින් කය වචනය හික්මවා ගන්න ඕන. කය වචනය හික්මවා ගත්තට පස්සේ සිතේ එපමණකිනුත් යම්කිසි විවරයක් ඇතිවෙනවා. පසුතැවිලි නැතිව සුචරිතයට යොමුවෙලා. අන්න ඒ විවරය තුළින් ඊළඟට සමාධිය. යම්කිසි කමටහනක් පිහිට කරගෙන හිත එකඟ කර ගන්නවා. එකඟ වුනු සිතෙන් තමයි මේ ලෝකයේ යථා ස්වභාවය අවබෝධ කර ගන්න පුළුවන් වන්නේ. ඒක තමයි විදර්ශනාව කියලා කියන්නේ. විශේෂ දැකීමක්. ඒ විදර්ශනා වශයෙන් ඒ විදියට දියුණු කර ගත්තු සිතට අන්න කයේ යථා ස්වභාවය පේනවා. කය අනුව පවත්නා වේදනාවල් - කායානුපස්සනා, වේදනානුපස්නනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා කියල ඔය සතර සතිපට්ඨාන වශයෙන් දක්වන්නේ. මේ කය අනුව බලනවා කය අනුව බලනවා කියල කියන්නෙත් මේ කය මගේ කියලා හිතනවා නෙවෙයි. මේ කය කය හැටියටම බලනවා. මගේ හෝ වේවා අනුන්ගේ හෝ වේවා මේ කය කියන එකේ මේ ධර්මතාව ඒ ආකාරයෙන්ම දැකීමයි කායානුපස්සනා කියලා කියන්නේ. ඒ වගේම මේ කය අනුව තිබෙන වේදනාවනුත් මේවා එන යන දේවල් හැටියට දුක් වේදනා හෝ සැප වේදනා හෝ මධ්‍යස්ථ වේදනා හෝ මේ මේ විදියයි කියලා ඒවායේ එන යන ආකාරය බලනවා. ඒ වගේම සිත, සිතේ හැසිරීම, සිත ඒ ඒ අවස්ථාවල් වල වෙනස්වන ආකාරයෙන් සිතට අරමුණු වන දේවල් හැම එකකම අර සමාධි සිතෙන් බලන කොට අනිත්‍යතාව ඉබේටම පැහැදිලිව පෙනෙනවා. මේ එකක්වත් රඳන්නේ නෑ. ඇති වෙනවා. පවතිනවා, නැතිවෙනවා කියන ඒ සංඥාව එනවා. ඉතින් ඒක දැකීමට උපකාර වෙනවා සතිය කියලා කියන ඒ

සිහිය. හොඳට සිහිය පිහිටුවාගෙන සමාධිමත් සිතකින් එදිනෙදා ජීවිතය ගෙවන කොට මේ තම තමන්ගේ ශරීරයත් අනුන්ගේ ශරීරත් පිළිබඳ යථා තත්ත්වය අවබෝධ වෙනවා. ලෝකයේ තමන් පරිහරණය කරන හැම වස්තූන්ගේම අනිත්‍යතාව.

ඇත්ත වශයෙන්ම අපි මේ පරිහරණය කරන එකකින් ගතයුතු නියම ප්‍රයෝජනය එදිනෙදා සිතන ප්‍රයෝජන නෙවෙයි. ඒවා අර ධර්මයට යොමු කරල ඒවා අනිත්‍යතාව දැකීමට නිදර්ශන හැටියට බලන්නට ඕන. ලෝකය දිහා අමුතු දෘෂ්ටියකින් ධර්මානුකූල දෘෂ්ටියකින් බලනකොට ජීවිතයේ හැම අවස්ථාවක්ම මේ ධර්මයට නගලා - මේක තුළින් බුදු පියාණන් වහන්සේ දේශනා කළ චතුරාර්ය සත්‍යය දකින්න පුළුවන් වෙනවා. එදිනෙදා ලැබෙන අත්දැකීම් තුළිනුත්. දන් ඔය දුඃඛ ආර්ය සත්‍යය කියලා කියන්නේ මේ මුළු මහත් පැවැත්ම දුකක් කියන එක. මේ පැවැත්මේ දුකින් කොටසක් තමයි මේ මගේ අත්දැකීම් තුළ තිබෙන්නේ කියලා. ඊළඟට ඒක හොඳට විමසලා බලන කොට ඒකේ යටින් යම්කිසි තණ්හාවක් තිබෙන බව තමන්ට වැටහෙනවා. එතකොට ඒ තණ්හාව යම් අවස්ථාවක නැතිකර ගත්තානම් එපමණකින් යම්කසි සැනසීමක් තිබෙනවා. ඉතින් ඒක ඒ දැකීමට උපකාර වන දර්ශනය තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය කියලා කියන්නෙ. හරි දැක්ම පහළ කර ගන්නවා. සම්මා දිට්ඨිය කියලා කියන ලෝකයේ ඇත්ත ඇති හැටියට දැකීමේ ශක්තිය. ඒක ඇති කර ගත්තහම ඇතුළත ඇතිවන පරිවර්තනයමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය හැටියට දක්වෙන්නේ. ඒ මාර්ගය හැටියට දක්වෙන්නෙ. ඉතින් ඒ මාර්ගයෙ ගමන් කිරීමට ඇත්ත වශයෙන්ම ශීලයෙන් ආරම්භා කරලා සමාධියෙන් සිත එකඟ කරලා ඊළඟට තමයි මේ ලෝකයේ බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළ ආකාරය දකින්න පුලුවන් වන්නේ.

ඉතින් ඒක නිසා මේ පින්වතුන් අර බුදු පියාණන් වහන්සේගේ මව්පියන් ඒතරම් ඉක්මණින් රහත් වුනයි අපිත් එහෙමමයි කියල හිතන්න නරකයි. අපි උත්සාහ දරන්න ඕන ඒ සඳහා. විශේෂයෙන්ම ඒකට උපකාර වෙන දේ තමයි දන් මේ පින්වතුන් මේ අවස්ථාවේ ශීල සමාදානාදියෙන් බණභාවනාදියෙන් කරන්නේ. ඉතින් අපේ බලාපොරොත්තුව මේ දීර්ඝ සංසාරේ යාම නොවෙයි. අපි කල්පනා කරන්න ඕන, බොහෝ දෙනා දුක කෙළවර කරන්න හිතුවත් භවය පිළිබඳ ප්‍රාර්ථනා තිබෙනවා. මේ පැවැත්මේ රැඳී ඉඳගෙනම දුක කෙළවර කරන්න බොහෝ දෙනෙක් උත්සාහ කරනවා. නමුත් ඒක හරියන්නේ නැ. බුදුපියාණන් වහන්සේ විතරයි මේකට ඒකාන්ත විසඳුමක් පෙන්නා දුන්නෙ. ඇත්ත වශයෙන්ම මේ භවය පවතින්නේ අර තණ්හාව නිසයි. මේ තෘෂ්ණාව කියලා කියන මේ නොසංසිඳෙන ආශාව

සිත් තුළ තිබෙන තාක් අපිට බැහැ මේ සංසාරයෙන් මිදෙන්න. මොකද ඒක තුළ තිබෙනවා අර හිත නැවත පැවැත්මක් බලාපොරොත්තු වන තත්ත්වයක්. එතකොට ඒ බලාපොරොත්තු ඉවත් කිරීම තමයි බුදු පියාණන් වහන්සේ මේ ශීල, සමාධි, ප්‍රඥා වශයෙන් එහෙම නැත්නම් ආර්ය අෂ්ටාංගික මාර්ගය - මේ මාර්ගය දක්වලා තිබෙන්නෙ සතර සතිපට්ඨාන ආදී මේ හැම එකකින්ම. අපේ මේ සිත තුළ තිබෙනවා ඒ ශක්තිය. හිත යම්කිසි අවස්ථාවක මේකෙ යථා ස්වභාවය අවබෝධ කර ගත්තා නම් ඒ අවස්ථාවේ ඇලීම ගැටීම දෙකෙන්ම ඉවත් වෙලා හිත මධ්‍යස්ථ තත්ත්වයට පත් වෙනවා. උපේක්ෂාව කියලයි කියන්නේ. නිවන කියලා කියන්නෙ උපේක්ෂාවේ උච්චම අවස්ථාවයි. ගැඹුරුම අවස්ථාව. උපේක්ෂාව කියල කියන කොට අන්න එතන තියෙන්නෙ ගිලිහී නොයන තත්ත්වයයි. මධ්‍යස්ථ තත්ත්වයට පැමිණියට පස්සේ යමක් අල්ල ගන්නෙත් නැහැ. අත්හරින්නෙත් නැහැ.

ඒ අවස්ථාවේ පුදුම අන්දමේ සැනසීමක් තියනවා. සාමාන්‍ය ලෝකයා ඇලුම් ගැටුම් දෙකිනුයි විනෝදයක් සතුටක් ලබන්නෙ. නමුත් බුදුපියාණන් වහන්සේ දක්වා වදාළා ඉතාමත්ම සියුම් සැපයක් තිබෙනවා මේ උපේක්ෂාව මධ්‍යස්ථ බව කියන එකේ. ඒ මධ්‍යස්ථ බව තුළින් 'අර සිත පුදුම අන්දමේ සංසිඳීමකට පත්වෙනවා. ඒ සංසිඳීමේ අවසාන කෙළවර තමයි නිවන කියලා කියන්නේ. එතකොට අමුතු ලෝකයක් නෙවෙයි මෙතන මේ නිවීම කියලා කියන්නේ. අර බුදුපියාණන් වහන්සේ දුන්නු උපමාවෙම තිබෙනවා. ලැව් ගින්නක් පැතිරෙනකොට ඒකට එකතු වෙන්න එකතු වෙන්න ඒ ගින්න මහ භයානක ගින්නක් බවට පත් වෙනවා - ගහෙන් ගහට එකතු වෙලා යනකොට මහ ගින්න, ඒ වගේම තමයි අපි එක එක්කෙනෙක් ගැන හිතන කොට ලැව් ගින්නක් හැටියට හිතුවට කමක් නෑ. අනන්ත කාලයක් මේ දීර්ඝ සංසාරේ අපි අර විදියට දව දවා දැවි දැවී ගිහින් තියනවා. අපි මේ පැවැත්ම කියලා කියන්නේ මේ දැවීමට ගන්න උත්සාහයක් පමණයි. අන්තිමට මෙයින් දැවෙන්නෙත් අපිමයි. අන්න ඒක නිසා මේ උපාදානය කියන එකේ තණ්හාවේ වගේම දෙබිඩි ස්වභාවයක් තිබෙනවා. ගින්න දර අල්ල ගන්නවා. දර ගින්න අල්ල ගන්නවා. අන්න ඒවගේ දෙයක් මෙතන. එතකොට අපි අල්ල ගන්න දේත් අල්ල ගන්න අපත් කියන මේ දෙකොටසම දැවෙනවා. ඒකයි බුදුපියාණන් වහන්සේ සමහර අවස්ථාවල ප්‍රකාශ කළේ මහණෙනි, ඇසත් දැවෙනවා, රූපයත් දැවෙනවා, කණත් දැවෙනවා, ශබ්දයත් දැවෙනවා, දිවත් දැවෙනවා, රසත් දැවෙනවා, මේ හැම එකක්ම දැවෙන හැටියට බුද්ධඥානයට පෙනී ගියේ ඒකයි. අර ගින්නත් දැවෙනවා. ගින්නට අහුවෙන දරත් දැවෙනවා. ඒක තමයි බුදුපියාණන් වහන්සේ සමහර අවස්ථාවල මේ එක වචනෙකට වගේ කෙටි කරලා

පෙන්නුවෙ "සබ්බං ආදිත්තං" හැම දෙයම ගිනි අරගෙන දැවෙනවා කියලා. මුළු ලෝකයම දැවෙනවා කියලා.

ඉතින් මුළු ලෝකයම දැවෙනවා කියන මේ දර්ශනය - සාමාන්‍යයෙන් තරුණ පිරිසට එහෙම මේක අහනකොට පුදුම හිතෙකවා "මෙතරම් මේ විනෝද වෙන්න පුළුවන් ලස්සන දේවල් ප්‍රියමනාප දේවල් තියෙද්දි බුදුපියාණන් වහන්සේ මොකද මුළු ලෝකය දැවෙනවා කියල කිව්වේ?" නමුත් ඔන්න ඕකයි නියම තත්ත්වය. එතකොට අපි මේ ජීවිතය කියලා කියන්නේ එහෙම පිටින්ම - මේ එක ජීවිතයක් ගන්න - ගැටළු ඔස්සේ ප්‍රාර්ථනා ඔස්සේ දුව් දුවී රෑ නිදි නැහැ. දුව් දුවී ගත කරනවා. ඊළඟ භවය කියල කියන්නෙත් ඒකයි. මෙතෙන්දී දවල මේ දර මදි වුනාම තව දර එකතු කර ගන්නවා. ඔය විදියට එක එක පුද්ගලයා ලැව් ගින්නක් හැටියට සැළකුවත් කමක් නෑ. ඉතින් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ මේ ලැව් ගින්න සංසිඳවීමේ ක්‍රමයයි. ඒකට උපකාර වන්නේ - අර අතන උපමාවේ දැක්වූ ආකාරයට, ගින්නක් පැතිරෙන්න උපකාර වෙන්නේ වාතය නම් ඒ සුළඟ නැතිවෙන කොට ඒ ගින්න තවත් ඈතට විහිදිල යන්නේ නෑ. එතකොට අපට කරන්න තියෙන්නේ අන්න ඒ අර උපාදානය හැටියට මරණ අවස්ථාවේ සිටින තණ්හාව. තණ්හාව තමයි අල්ල ගන්නෙ. ඒ තණ්හාවයි අල්ලා ගන්නෙ තවත් දෙයක්. ඒක නිසා තණ්හාව මෙතෙන්දීම සංසිඳෙව්වොත් ඔන්න මීට එහාට යන්නේ නෑ. මෙතනින්ම ඉවරයි. මෙතනින්ම ඉවරයි කියල කියන්නේ මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධාතු හතරෙන් සකස්වුනු අර මව්පියන්ගේ උපකාරයෙනුත් මේ ආහාර පාන ආදියෙනුත් ගස්කොළන් ආදියෙන් ලබා ගන්නා ඒ හැම දෙයක් තුළිනුත් අපි මේ ගොඩනගා ගත්තු ශරීර කූඩුව පොළවට භාර දෙනවා. පොළවට අයිති දේ පෝළවටම භාරදෙනවා. පස්වලින් සෑදුන දේ පස්වලටම භාරදෙනවා. ඊළඟට ඉදිරියට ගෙනියන්න දෙයක් නෑ. ඇයි තණ්හාව නෑ නේ. ආසාවක්, ප්‍රාර්ථනාවක්, බලාපොරොත්තුවක්, පිපාසයක් නෑ. පිපාසයක් නැති මිනිහෙකුට වතුර පොවන්න යන එක වගේ තමයි රහතන් වහන්සේ කෙනෙකුට තවත් භවයක් පිළිබඳ උනන්දුවක් ඇති කරවන්න බලාපොරොත්තු වීම.

අන්න එතකොට බුදුපියාණන් වහන්සේ නියම අන්දමින්ම මේ සංසාර ගැටළුවට පිළිතුරු දුන්න. අර අනිකුත් ශාස්තෘවරු නොයෙකුත් දේවල් කිව්වට මොකද විමුක්ත පුද්ගලයා අභවල් තැන උපන්නා කියලා බුදුපියාණන් වහන්සේ එහෙම කියන්න බැරි නිසාමයි ඒ වෙනුවට වෙන විසඳුමක් දුන්නේ. මෙතන නියම විසඳුම මොකක්ද, රහතන් වහන්සේ කරල තියෙන්නේ තණ්හාව කපා හැරියා. අර සසරට බැඳිල තිබෙන බැමි

කොකු අනික් පැත්තට හැරෙව්වා. ඊළඟට මානය කියලා කියන අස්මි මානය, මමය මාගේය කියලා කියන ඒ බොරු මානය, ඒකේ යථා ස්වභාවය අවබෝධ කරගෙන දුක කෙළවර කරගත්තා. ඔච්චරයි විමුක්ත පුද්ගලයා පිළිබඳව කියන්න තියෙන්නේ, අසුවල් තැනක උපන්නා කියන එක නොවේ. අන්න ඒක නිසා බුදුපියාණන් වහන්සේ නිවැරදි පිළිතුරයි එතන දීලා තියෙන්නේ. අර වච්ඡගොත්ත පරිබ්‍රාජකයාට තේරුනෙත් නෑ. දැන් ඉන්න බොහෝ පඬිවරුන්ට තේරෙන්නෙත් නෑ. ඒ අය කල්පනා කරනවා නිවන කියල කියන්නේ යම්කිසි සදාකාලික පැවැත්මක් කියල. නමුත් බුදුපියාණන් වහන්සේ වදාළ භවය සම්පූර්ණයෙන්ම අනිත්‍යයි. දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝක පවා. නිත්‍ය පැවැත්මක් කිසිසේත් සොයා ගන්න බෑ. ඒ වෙනුවට කරන්න තිබෙන්නේ මේ ලෝකයේ යථා ස්වභාවය අවබෝධ කරගෙන මේ හැම දෙයක්ම අත් හරින එකයි. මේ හැම එකම අනිත්‍යතා ධර්මයට යටයි කියන අවබෝධය ඇති කරගෙන අන්න අර ගින්න මෙතෙන්දීම නිවා ගැනීමයි. ඒ නිවීම තමයි නිවනය කියලා කියන්නේ.

එතකොට පින්වතුනි, මෙන්න මේ නිවීම තමයි හැම බෞද්ධයකුගේම පරමාර්ථය විය යුත්තේ. පැවැත්ම නොවෙයි නැවැත්මයි. අන්න ඒක හොඳට හිතට දමා ගෙන ඒක ඇත්ත වශයෙන්ම නැවත භවයකට දාන්න නරකයි. මේ බුද්ධෝත්පාද කාලයේ දුර්ලභ වූ සද්ධර්මය දුර්ලභ වූ මනුෂ්‍ය ආත්ම භාවය ලබාපු අවස්ථාවක අපි මේ හැම ධර්ම දේශනාවකින්ම පෙරල ගන්න ඕන අනෙකුත් සාමාන්‍ය කතන්තරයේ සිද්ධි වලින් ලබන විනෝදය නෙවෙයි. ඒවා තුළ ඇති ගැඹුරු ධර්මයි. ඒවා තමන්ගේ ජීවිතයට උපකාර කර ගන්න උත්සාහවත් වෙන්න ඕන. එතකොට මේ පින්වතුනුත් තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් යම් කිසි ශීලයක පිහිටලා කය - වචනය හික්මවාගෙන මේ අවස්ථාවේ පැයක් පමණ වේලා අර සද්ධා විරිය, සති, සමාධි, පඤ්ඤා කියලා කියන ඒ ගුණ ධර්ම දියුණු කරගන්ට උපකාර වෙන්නා වූ නිවනින් කුළු ගැන්වෙන එක්තරා වටිනා දේශනාවකට කන් දුන්නා කියල හිතා ගන්න ඕන. බුදුපියාණන් වහන්සේගේ චරිතය තුළිනුත් දේශනාව තුළිනුත් හැම එකක් තුළින්ම ලෝකයාට පුදුම අන්දමේ ආදර්ශයක් දීලා තිබෙන්නේ. එතකොට මේ මරණ සතිය විශේෂයෙන්ම තම තමන්ගේ ජීවිතය තුළින්ම - මේක මරණ අවස්ථාවේ, අනෙකුත් කෙනෙකුත් මළ ගිය අවස්ථාවේ සිතට නගා ගත යුතු දෙයක් හැටියට නොවෙයි. හැම මොහොතකම එළඹ සිටි දෙයක් හැටියට තම තමන් තුළම මේ මරණය ක්‍රියාත්මක වෙනවා. ශරීරය තුළ මරණය පදිංචිවෙලා ඉන්නවා කියලා කියන තරමටම වාගේ කල්පනා කරගෙන මේ හැම එකකම යථා ස්වභාවය හිතට දාගෙන ජීවත් වෙනවා නම් එබඳු පුද්ගලයාට

අර ඇලුම් ගැටුම් ඒ වගේම ශෝක, මසුරුකම්, ගිජුකම්, ලෝභකම්, ආසාවන් ඒවා ක්‍රම ක්‍රමයෙන් තුනීවෙලා අන්න බුදුපියාණන් වහන්සේ දක්වා වදාළ අර උපේක්ෂාවෙන් ලැබිය හැකි ඉතාමත්ම සියුම් අන්දමේ ශාන්ත වූ උතුම් වූ ඒ සැනසීම ලබාගන්න පුළුවන් වෙනවා.

ඒක නිසා දැන් මේ පැයක් පමණ වෙලා පින්වතුන් රැස් කරගත්තු කුසල සම්භාරය ඊළඟට ධර්මශ්‍රවණ ආනිශංස වශයෙන් සද්ධා විරිය සති, සමාධි, පඤ්ඤා කියන ඉන්ද්‍රිය ධර්ම බල ධර්ම වලට හේතුවන යම් කුසල ධර්මයන් එකතු කර ගත්ත නම් ඒවායේ ශක්තිය උපකාර කරගෙන කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබා ගෙන මේ ජීවිතයේදීම හැකිතාක් උත්සාහ කරලා බණ භාවනා කරලා අවම වශයෙන් සෝවාන් තත්ත්වය හෝ ලබාගෙන මේ අතිභයානක සංසාර දුඃඛයෙන් අත් මිදිලා උතුම් අමා මහ නිවනින් සැනසෙන්නට මේ ධර්මශ්‍රවණ ආනිශංසයත් ඒකාන්තයෙන් හේතු වාසනා වේවා කියල ප්‍රාර්ථනා කරගන්න. ඒවාගේම අවීචියේ සිට අකනිටා දක්වා වූ සියලුම සත්ත්වයින් - මේ සංසාර දුකෙහි ගැලී සිටින සත්ත්වයින් - යම් කෙනෙක් ධර්ම ශ්‍රවණ ආනිශංස වශයෙන් ලබාගත හැකි පින්, ධර්මදේශනාමය වශයෙන් ඒ රැස්කරගත්තු පින් අනුමෝදන් වෙන්න කැමතිනම් ඒ හැම කෙනෙක්මත් ඒ අනුමෝදන් වී හැකිතාක් ඉක්මණින් අජරාමර සංඛ්‍යාත වූ උතුම් අමා මහ නිවනින් සංසාර දුක්ඛය කෙළවර කරගනිත්වා කියන ඒ ප්‍රාර්ථනාවත් ඇති කර ගෙන මේ ගාථා කියලා පින් දෙන්න.

**'එත්තාවතා ච අම්හෙහි...........'**